# විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට දායක වන ආකාරය

එන්. ආර්. එන්. වීරසේකර[1]

**සංක්ෂේපය**

ලෝකයේ සංවර්ධනය වන බොහෝ රටවල ක්‍රමයෙන් වර්ධනයවන ප්‍රධාන මූල්‍ය ප්‍රවාහයක් ලෙස විදේශ ප්‍රේෂණ හඳුනා ගැනේ. 1977 දී විවෘත ආර්ථික ප්‍රත්පත්තිය හඳුන්වා දීමෙන් පසු ශ්‍රී ලංකාවේ රජය මැදිහත් වීමෙන් ප්‍රවර්ධනය කළ අංශයක් වශයෙන් විදේශ සේවා නියුක්ති අංශය පෙන්වා දිය හැකි අතර ශ්‍රම විගමනිකයින් විසින් මෙරට තම කුටුම්භයන්ට එවනු ලබන ප්‍රේෂණ ප්‍රවාහයන් ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන විදේශ විනිමය ඉපැයුම් මාර්ගය වී ඇත. මෙම ලිපියෙන් සලකා බලනුයේ ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්තියේ ආරම්භය, ස්වභාවය, විකාශනය හා විදේශීය ප්‍රේෂණ ශ්‍රී ලංකාවේ ආර්ථිකය සංවර්ධනයට කුමනාකාරයෙන් බලපාන්නේදැයි විමසා බැලීමයි. මේ සඳහා පොත් පත්, සඟරා, ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා, සංක්‍රමණය හා විදේශීය ප්‍රේෂණ පිළිබඳ ලෝක මෙන් ම ශ්‍රී ලංකානු වාර්තා, පර්යේෂණ ලිපි යනාදී ද්විතීය මූලාශ්‍රයන්ගේ දත්ත භාවිතා කර ඇත. වර්තමානය වන විටවිදේශීය ප්‍රේෂණ සඳහා ස්ත්‍රී දායකත්වය අභිබවමින් පුරුෂයින්ගේ දායකත්වය ක්‍රමයෙන් වර්ධනය වී ඇති අතර විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට ආරම්භයේ සිට ම සාර්ව මෙන් ම සූක්ෂම මට්ටමින් ධනාත්මක ව දායක වී ඇති බව හඳුනා ගත හැකි ය.

**මුඛ්‍ය පද :** විවෘත ආර්ථික ප්‍රතිපත්තිය, ශ්‍රම සංක්‍රමණය, විදේශීය ප්‍රේෂණ, විදේශ සේවා නියුක්තිය, ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය

## හැඳින්වීම

වර්තමාන ගෝලීය ආර්ථික සන්දර්භය තුළ විදේශ ප්‍රේෂණ ප්‍රවාහයන් ලෝකයේ බොහෝ අඩු දියුණු රටවල නිරන්තරයෙන් වර්ධනයවන මූල්‍ය ප්‍රවාහයක් ලෙස පෙන්වා දිය හැකි ය. 2015 වසරේ ලෝකයේ ඇස්තමේන්තු ගත ප්‍රේෂණ ප්‍රවාහයේ වටිනාකම ඇ. ඩො. බි 601 ඉක්මවයි. මෙයින් සංවර්ධනය වන රටවල් ඇ. ඩො. බි 441 ක් හෙවත් බහුතරයකට හිමිකම් කියයි (Migration and Remittances Fact Book 2016). 1988 වසරේ දී සංවර්ධනයවන රටවල් කරා ප්‍රේෂණ ප්‍රවාහයන් ඇ. ඩො. බි 20 ක් ගලා ගියත් 2007 වර්ෂයේ දී එය ඇ. ඩො. බි 328 ක් දක්වා පහළොස් ගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකින් වර්ධනය වී ඇත (UNITED NATION, 2011). ප්‍රේෂණ ප්‍රවාහයන් සංවර්ධනය වන රටවලට ගලා එන විදේශ සෘජු ආයෝජන, නිල සංවර්ධන ආධාර යනාදී සාම්ප්‍රදායික මූල්‍ය ප්‍රවාහයන්ට සාපේක්ෂව වඩාත් ස්ථාවර මූල්‍ය ප්‍රවාහයක් ලෙස හඳුනා ගැනේ. මෙලෙස ලබාගන්නා විදේශීය ප්‍රේෂණ සූක්ෂම මට්ටමේ දී කුටුම්භ ආදායමට, පාරිභෝජනයට, ඉතුරුම් හා ආයෝජනයට මෙන් ම

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා තෙවන වසර, nrnw12345@gmail.com

වත්කම් රාශීකරණයට බලපෑම තුළින් කුටුම්භ ආර්ථික සුබසිද්ධිය ඉහළ නැංවීමට දායක වෙයි. තව ද සාර්ව මට්ටමේ දී ජාතික ආදායමට, ජාතික ඉතුරුම්, සේවාවියුක්තියට හා ආයෝජනයට, ගෙවුම් ශේෂයට ධනාත්මක ලෙස බලපෑම තුළින් ආර්ථික වෘද්ධිය වේගවත් කරන අතර ම පැහැදිලි සාර්ව ආර්ථික වටපිටාවක් ගොඩනැංවීමට දායක වෙයි. විශේෂයෙන් සංවර්ධනයවන රටවල්වලට උරුම වූ දුප්පත්කම, අසමානතාව යනාදී ගැටළුවලින් අත් මිදීමටත්, ඉහළ සංවර්ධන තලයක් කරා යාමටත්, උපකාරී වන්නා වූ ප්‍රධාන විදේශ විනිමය ඉපැයුම් මූලාශ්‍රයක් වශයෙන් විදේශීය ප්‍රේෂණ විශාල කාර්යභාරයක් ඉටු කරයි. මේ නිසා ශ්‍රී ලංකාව වැනි ලෝකයේ අඩු දියුණු බොහෝ රටවල ආර්ථික වෘද්ධියට මෙන් ම සංවර්ධනයට දායක වන ස්ථාවර විනිමය ඉපැයුම් මාර්ගයක් වශයෙන් ප්‍රේෂණ ප්‍රවාහයන් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබයි (Migration and Remittances Fact Book 2016).

වර්තමානය වන විට ගෝලීයකරණ ක්‍රියාවලිය වඩාත් ශක්තිමත් වී ඇති අතර දේශ සීමා ඉක්මවා ගිය ජාතික රාජ්‍යයන් අතර නිෂ්පාදන සම්පත්, තාක්ෂණය, ප්‍රාග්ධනය, මානව සම්පත් ආදිය නිදහසේ සංචලනය වීම පෙර නොවූ විරූ ලෙස වර්ධනය වී ඇත. මෙම ක්‍රියාවලියේ දී ලෝකයේ බොහෝ රටවල් ගෝලීය ආර්ථිකයේ ප්‍රතිලාභ උකහා ගැනීමට තම ආර්ථික ක්‍රම විවෘත අර්ථික ක්‍රම බවට පත් කළේ ය (අතපත්තු,2012). ශ්‍රී ලංකාව ද එයට අනුව යමින් 1977 න් පසු කාලය විවෘත ආර්ථික ප්‍රතිපත්ති ක්‍රමය අනුගමනය කිරිමට පියවර ගත් අතර එම කාලයේ පටන් ම අද දක්වා ම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට ප්‍රමුඛ ලෙස දායක වූ අංශයක් ලෙස විදේශ සේවා නියුක්තිය පෙන්වා දිය හැකි ය.

ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්තිය ආරම්භ වූ මුල් කාලයේ උගත් හා ඉහළ වෘත්තීය කුසලතාවලින් හෙබි වෘත්තිකයන් විදේශ ගත වීම හඳුනා ගත හැකි වුවත් 1970 න් පසු කාලයේ දී මැද පෙරදිග කලාපය ශ්‍රී ලංකාවේ ශ්‍රමය සඳහා ප්‍රධාන වෙළෙඳපොළක් විය. පසු කාලීනව සුළු වශයෙන් නැගෙනහිර ආසියාතික රටවල් වන කොරියාව, සිංගප්පූරුව යනාදී රටවල් නව සංක්‍රමණික මාර්ගයක් වශයෙන් පෙන්වා දිය හැකි ය. මෙම විදේශ සේවා නියුක්කිකයින් විසින් මෙරටට එවනු ලබන ප්‍රේෂණ ශ්‍රී ලංකාවේ විදේශීය විනිමය ඉපැයුම් මාර්ගවල ප්‍රධාන මූලාශ්‍රයක් වන අතර එය සංචාරක කර්මාන්තය, තේ අපනයනය රෙදිපිළි හා ඇඟලුම් යනාදී විනිමය ඉපැයුම්වලට වඩා ඉහළ අගයකි. 2014 වර්ෂයේ දී පුද්ගලයින් 300,413 ක් විදේශ රැකියා සඳහා පිටත්ව ගොස් ඇති අතර මුළු විදේශ සේවා නියුක්තිකයින් විසින් මෙරටට එවන ලද ප්‍රේෂණ ප්‍රමාණයේ මුළු වටිනාකම රු.මි 916,367 ක් විය (විදේශ රැකියා අමාත්‍යංශය කාර්ය සාධන වාර්තාව 2015). මෙලෙස එවනු ලබන ප්‍රේෂණ සූක්ෂම මෙන් ම සාර්ව මට්ටමින් ද ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට විශාල දායකත්වයක් සපයයි (බබාමා, 2012).

**ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්තියේ ආරම්භය හා විකාශනය**

මෙරට විදේශ සේවා නියුක්තිකයින් වශයෙන් මුල් ම සංක්‍රමණය වාර්තා වනුයේ යටත් විජිත සමයට අයත් 20 වන සියවසේ මුල් භාගයේ දී ද්‍රවිඩ ජනයා සුළු

වශයෙන් මැලේසියාවට සංක්‍රමණය වීම යි. මින් පසුව 1948 නිදහස ලැබීමෙන් අනතුරුව ශ්‍රී ලාංකිකයින් සිංගප්පූරුව හා හොංකොං යනාදී රටවලට සංක්‍රමණය විය. 1960 න් පසු කාලයේ දී අධ්‍යාපනින වශයෙන් මෙන් ම වෘත්තීය මට්ටමින් ද ඉහළ නිපුනතා ඇති පිරිස් කැනඩාව, ඕස්ට්‍රේලියාව, එක්සත් රාජධානීය වැනි රටවලට සංක්‍රමණය විය (ප්‍රියදර්ශනී, 2014). 1970 න් පසු කාලයේ මැද පෙරදිග කලාපයේ තෙල් මිල ඉහළ යාමත් සමඟ එම රටවල විශාල අතිරික්ත ආදායමක් උපයා ගත් අතර මෙය තම රටවල ආර්ථික සංවර්ධනයට උපකාරී වන ගොඩනැගිලි, ව්‍යාපෘති, යටිතල පහසුකම් යනාදීය දියුණු කිරිමට යෙදවීය. මෙමගින් ඇති වු සංවර්ධනයත් සමඟ මෙම කලාපයේ රටවල ශීඝ්‍ර නාගරීකරණයක් සිදු විය. නමුත් මෙම සංවර්ධන ක්‍රියාවලියත් සමඟ ම පැන නැගුණු මූලික ගැටළුවක් වුයේ මිනිස් බල හිඟයයි. සංස්කෘතික හේතු සාධකවල බලපෑමෙන් ස්ත්‍රීය සේවා නියුක්ත නොවීමත් කය වෙහෙසා වැඩ කිරිම අවමානයක් ලෙස සැලකීමත් නිසා පුරුෂ පක්ෂය ද සේවා නියුක්ත වීමට මැලි විය. ධනෝපායන මාර්ගවලින් ඉහළ ආදායම් ඉපයීමත් නිසා වැඩි ලාභදායීත්වය හා පහසුව යනාදී සියළුම සාධකයන්ගේ බලපෑමෙන් තම රටවලට අවශ්‍යවන ශ්‍රමය සංක්‍රමණික සේවා නියුක්තිකයින්ගෙන් ලබා ගැනීමට අවස්ථාව උදා විය. ශ්‍රී ලංකාවේ ආර්ථිකය මෙම කාලයේ දී පවතින ජනගහන වර්ධනයට සාපේක්ෂව සේවා නියුක්ති අවස්තාවන් වර්ධනය නොවීමත් නිසා සේවා වියුක්තිය මෙන්ම දරිද්‍රතාව රට පුරා ම මුල් බැසගත් කරුණු විය. 1977 න් පසු කාලයේ විවෘත ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කරනු ලැබුවත් කෘෂි, කාර්මික සේවා යන අංශයන්ගෙන් මෙම ගැටළු නිරාකරණයට එතරම් දායකත්වයක් නොවී ය. මෙහිදී බහුතර පිරිසකගේ දරිද්‍රතාව හා අසමානතාව අවමවන සේවානියුක්ති අවස්ථාවන් වර්ධනය වන පරිදි රට තුළ ප්‍රමාණවත් ආර්ථික වෘද්ධි අනුපාතයක් පවත්වා ගැනීමට නොහැකි විය. මෙම තත්ත්වයන් නිසා මැද පෙරදිග කලාපයේ ඇති වු ශ්‍රම ඉල්ලුමත් සමඟ ශ්‍රී ලංකාවේ විශාල වශයෙන් පුහුණු මෙන් ම නුපුහුණු ස්ත්‍රීන් සහ පුරුෂයින් ද  කාර්මික , කම්කරු, රියදුරු, ගෘහ සේවිකා, ගෘහ පාලිකා, ජුකී මැෂින් ක්‍රියාකරුවන් වැනි රැකියා අංශ නියෝජනය කරමින් මැද පෙරදිග කලාපයට සංක්‍රමණය විය (ආර්ථික විමසුම, 1996 ජනවාරි). මෑත කාලයේ දී තරුණ පිරිස් නැගෙනහිර ආසියාතික රටවල් කරා සංක්‍රමණය වීමේ ප්‍රවනතාවක් හඳුනා ගත හැකි ය. 1970 න් පසු කාලය විදේශ සේවා නියුත්ති අංශය සංවර්ධනය කිරිමට රාජ්‍ය අංශයේ අවධානය යොමු වු අතර 1985 අංක 21 දරණ විදේශ රැකියා නියුක්ති පනත පිහිටු වීමත් සමඟ විදේශ සේවා නියුක්ති කාර්යාංශය ස්ථාපිත කළ අතර විදේශ රැකියා සඳහා පිටත් වන්නන්ගේ ආරක්ෂාව මෙන් ම ඔවුන්ගේ පවුල්වල සුබසාධන කටයුතු ප්‍රවර්ධනය කිරිමටත් රැකියා නියෝජිත ආයතනවල නෛතික කටයුතු අධීක්ෂණයටත් පියවර ගත්තේ ය. ඉන් අනතුරුව රට පුරා ම දිස්ත්‍රික් වශයෙන් කාර්යාල පිහිටුවීමට කටයුතු කළ අතර විදේශ රැකියා නියුක්ති පනතට අනුව විදේශ රැකියා සඳහා පිටත් වන සෑම ශ්‍රී ලාංකික පුරවැසියෙක් ම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය අනිවාර්ය කරන ලදී. මෙම ඇති වු හිතකර තත්ත්වය හේතුවෙන් විදේශ සේවා නියුක්තිකයින් වශයෙන් සංක්‍රමණය වීම වැඩි වීමක් හඳුනා ගත හැකි ය. මෙලෙස සිදුවන ශ්‍රම සංක්‍රමණිකයින් විදේශයන්හි දී ස්ථිර පුරවැසියන් ලෙස නොසලකන අතර සේවා ගිවිසුමේ වසර ගණන අනුව සංක්‍රමණික වීසා හිමි වන අතර නියමිත කාලය අවසන් වීමත් සමඟ සේවා නියුක්තිකයින් තම මව් රටට පැමිණේ (ප්‍රියදර්ශනී, 2014).


මුල් කාලයේ දී පුරුෂයින් විශාල වශයෙන් සේවා නියුක්තිනයින් ලෙස සංක්‍රමණය වී ඇති අතර පසුව පුරුෂයින්ට සාපේක්ෂව ස්ත්‍රීන් විශාල වශයෙන් සේවා නියුක්තිකයින් වශයෙන් සංක්‍රමණය විය. මෑත කාලයේ දී මෙම තත්ත්වය වෙනස්ව ගොස් අද වන විට ස්ත්‍රීන්ගේ ප්‍රතිශතය ක්‍රමයෙන් අඩු වී ඇති අතර පුරුෂයින්ගේ ප්‍රතිශතය ක්‍රමයෙන් වැඩි වී ඇත. 2014 වර්ෂයේ දී මුළු සේවා නියුක්තිකයින් 300,413 ක් සංක්‍රමණය වූ අතර ඉන් 189,924 ක් හෙවත් 63.22% පුරුෂයින් වෙයි. තව ද 110,489 ක් හෙවත් 36.78% ස්ත්‍රීන් වෙයි. මෙසේ සේවා නියුක්තිය සඳහා සංක්‍රමණය වන ස්ත්‍රීන් විශාල ප්‍රමාණයක් සංක්‍රමණය වනුයේ ගෘහ සේවිකාවන් වශයෙනි. එය 88,661 ක් වු අතර මුළු ස්ත්‍රී සංක්‍රමණිකයන්ගෙන් 80.24% ක අගයක් විය. සංක්‍රමණික දිශාවන් ගතහොත් වැඩි වශයෙන් සංක්‍රමණය වනුයේ කටාර් 84.571 (28.15%) සවුදි අරාබිය 80,539 (26.81%) එක්සත් අරාබි එමීර්රාජ්‍ය 50,192 (16.71%) කුවේට් 43,28 (14.49%) දකුණු කොරියාව 6,684 (2.22%) ජොර්ධානය 6,175 (2.06%) (ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ සංඛ්‍යානමය වාර්තාව, 2014).

### විදේශීය ප්‍රේෂණයන් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට දායක වන ආකාරය

විදේශීය ප්‍රේෂණ යනු විදේශ සේවා නියුක්තිනයින් විසින් මව් රටේ තම කුටුම්භයන්ට සහ හිතමිතුරන්ට එවනු ලබන මුදල් වේ (සාන්කර්, 2015). මෑත කාලීනව ගතහොත් සම්ප්‍රදායික අන්තර්ජාතික මූල්‍ය ප්‍රවාහයන් වන විදේශීය සෘජු ආයොජන හා නිල සංවර්ධන ආධාර යන මූල්‍ය ප්‍රවාහයන්ට වඩා ශක්තිමත් මෙන් ම ස්ථිරසාර මූල්‍ය ප්‍රවාහයක් වශයෙන් සංවර්ධනයවන රටවලට විදේශීය ප්‍රේෂණ පෙන්වා දිය හැකි ය. ශ්‍රී ලංකාවේ ද විදේශීය ප්‍රේෂණ ගෝලීය ආර්ථිකය තුළ කුමන වාතාවරණයක් පැවතියත් ක්‍රමිකව වර්ධනය වීමක් හඳුනා ගත හැකි ය (රාධා, 2012). මෙලෙස විගමනික ශ්‍රමිකයින් විසින් ශ්‍රී ලංකාවට එවනු ලබන ප්‍රේෂණ සම්ප්‍රදායික අපනයන වලින් ලැබෙන ආදායම ඉක්මවා යමින් රටේ ඉහළම ශුද්ධ විදේශීය ආදායම් ප්‍රභවය ලෙස හඳුනාගත හැකි ය. 1991 වර්ෂයේ දී ශ්‍රී ලංකාව විදේශීය පේෂණ රු. මිලියන 18,311 ක් ලබා ගත් අතර 2015 වර්ෂය වන විට එය පනස් ගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකින් වර්ධනය වී ඇති අතර එහි වටිනාකම රු මිලියන 948,957 ක ප්‍රමාණයකි. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් බලන විට එම අගය 8.5% ක ප්‍රතිශතයකි. ශ්‍රී ලංකාවේ විශාල වශයෙන් ගෘහ සේවිකාවන් සහ විවිධ වෘත්තීය මට්ටම්වල ශ්‍රමිකයින් මැදපෙරදිග කලාපයට සේවා නියුක්තිකයින් වශයෙන් සංක්‍රමණය විම නිසා ආරම්භයේ පටන් ම ඉහළ විදේශ ප්‍රේෂණ ගලා එන කලාපයක් ලෙස මැදපෙරදිග කලාපය පෙන්වා දිය හැකි ය. මුළු ප්‍රේෂණයන්ගේ සහ මැද පෙරදිග කලාපයෙන් මෙරටට ගලා එන ප්‍රේෂණයන්ගේ මෑත කාලීනව සිදු වූ වර්ධනය ප්‍රස්ථාර සටහන 01 මගින් නිරූපණය කෙරෙයි. මෙසේ එවනු ලබන විදේශීය ප්‍රේෂණ සූක්ෂම මෙන් ම සාර්ව මට්ටමින් ද ශ්‍රී ලංකාවේ සංවර්ධනයට දායක වී ඇති බව හඳුනා ගත හැකි ය (බබාමා, 2012).

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වල වර්ධනය**

ප්‍රස්ථාර සටහන 01:ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රේෂණයන්ගේ වර්ධනය 2000-2015




මූලාශ්‍රය:ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2015; ශ්‍රී ලංකා වි.සේ.නි.කා.සංඛ්‍යානමය වාර්තාව 2013

සංවර්ධනයවන රටවල කාර්මීකරණ ක්‍රියාවලිය සඳහා අත්‍යවශ්‍යය ප්‍රාග්ධන හා අන්තර් භාණ්ඩ ආනයනය කිරිමට අවශ්‍යයවන විදේශ විනිමය සංචිත ඒකරාශි කර ගැනීමට විදේශ ප්‍රේෂණවලින් ඉහළ දායකත්වයත් ලැබෙයි. 18 හා 19 වැනි ශතවර්ෂයන්හි දී යුරෝපය, ඇමරිකා එක්සත් ජනපදය වැනි රටවල් තම ප්‍රාග්ධන හා පාරිභෝජන භාණ්ඩ නිපදවීම තුළින් ඉහළ නිෂ්පාදනයකට උරුමකම් කීවේ ය. නමුත් ලෝකයේ අඩු දියුණු රටවල් දියුණු රටවලින් තම ආර්ථික සංවර්ධනයට අවශ්‍ය වන ප්‍රාග්ධන හා අන්තර් භාණ්ඩ මෙන් ම පාරිභෝගික භාණ්ඩ විශාල වශයෙන් ආනයනය කිරීමට සිදු විය. 1977 න් පසු කාලයේ දී ශ්‍රී ලංකාව විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දීමෙන් පසුව මෙම තත්ත්වය  පැහැදිලිව හඳුනා ගත හැකි ය. අපනයන ආදායමට වඩා ආනයන වියදම ක්‍රමයෙන් ඉහළ ගිය අතර අඛන්ඩ ගෙවුම් ශේෂ හිඟය මෙන් ම වෙළෙඳ හිඟය ද ක්‍රමයෙන් පුළුල් විය. කාලයත් සමග ම විදේශ සේවා නියුක්තිකයින් විසින් මෙරටට එවනු ලබන විදේශීය ප්‍රේෂණ ප්‍රමාණයේ වටිනාකම වැඩි වී ඇති අතර මෙමගින් ගෙවුම් ශේෂය මත හටගෙන ඇති අයහපත් පීඩනමය තත්ත්වයන් සමනය කිරීමට දායක වී ඇත. 2014 වසරේ දී ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්තිකයින් විසින් මෙරටට එවනු ලැබූ  විදේශීය ප්‍රේෂණ ජංගම ගිණුමේ හිඟය අඩු කරලීමට දායක වී ඇත (ශ්‍රී ලංකා මහ බංකුව 2014). මෙලෙස ප්‍රාග්ධන මෙන්ම අන්තර් භාණ්ඩ ලබා ගැනීමටත් නව තාක්ෂණය ග්‍රහණය කර ගැනීමටත් අවශ්‍යය විදේශ විනිමය සංචිත ඒකරාශී කරගත හැකි ස්ථාවර මාර්ගයක් ලෙස විදේශ ප්‍රේෂණ පෙන්වා දිය හැකි ය.රටක් අන්තර් ජාතික මූල්‍ය වෙළෙඳපොළෙන් ණය ලබා ගැනීමේ හැකියාව මෙමගින් තව දුරටත් ශක්තිමත් කරයි. යම්කිසි රටක විදේශ විනිමය හිඟ වන විට ණය ආපසු ගෙවීමේ හැකියාවට බලපෑම් කරයි. මෙවැනි තත්ත්වයක් තුළ විනිමය අනුපාතය චංචල වෙයි.

මෙවැනි ඇති විය හැකි කම්පනයන්ට වඩාත් ස්ථිරසාර පිළියමක් ලෙස විදේශ සේවා නියුක්තිකයින් විසින් මෙරටට එවනු ලබන ප්‍රේෂණ වඩා වැදගත් විනිමය ඉපැයුම් මාර්ගයක් වශයෙන් පෙන්වා දිය හැකි ය (බබාමා, 2012).

විදේශීය ප්‍රේෂණ ජාතික ඉතුරුම්වල කොටසක් නිසා විදේශ ප්‍රේෂණවල වර්ධනය ජාතික ඉතුරුම්වල වර්ධනයට හේතු වෙයි. දේශීය ඉතුරුම්වලට විදේශීය ශුද්ධ සාධක ආදායම සහ ශුද්ධ වර්තන සංක්‍රාම එකතු කිරීමෙන් විදේශීය ඉතුරුම් ගණනය කරන අතර වර්තන සංක්‍රාම සමන්විත වනුයේ ශුද්ධ පොදු වර්තන සංක්‍රාම සහ ශුද්ධ පෞද්ගලික සංක්‍රාම වලිනි. මෙලෙස විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ අයත් වනුයේ ශුද්ධ පෞද්ගලික සංක්‍රාම වලට ය (අතපත්තු, 2011). 2014 දී ජාතික ඉතුරුම් අනුපාතය 29.9% ක් වූ අතර ඉතුරුම් මගින් ආයෝජනයේ අරමුදල් සම්පාදනයට අවශ්‍ය සම්පත් සපයා දෙයි (ශ්‍රී ලංකා මහ බංකුව, 2015).සංවර්ධනය රටවල් වලට ආවේණික ගැටළුවක් වන ශ්‍රී ලංකාවේ ද දක්නට ලැබෙන ඉතුරුම් හා ආයෝජන පරතරය ලිහිල් කරලීම ජාතික ඉතුරුම් ඉහළ නැංවීම මගින් සිදු කළ හැකි ය. එය රටක සංවර්ධනයට අවශ්‍ය වඩාත් හිතකර තත්ත්වයක් ලෙස පෙන්වා දිය හැකි ය (පතිරගේ, 2011).

විදේශීය ප්‍රේෂණ සාර්ව ආර්ථික වටපිටාව තුළ දේශීය වශයෙන් මෙන් ම විදේශීය වශයෙන් ද අනපේක්ෂිතව ඇති විය හැකි තත්ත්වයන්ට මුහුණ දීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කරයි. මෑත කාලීනව ශ්‍රී ලංකාව දේශීය වශයෙන් කම්පන රැසකට මුහුණ දුන් අතර 2004 වසරේ දී ඇති වූ සුනාමි තත්ත්වය මෙන්ම විටින් විට රටේ නොයෙකුත් ප්‍රදේශවල ඇති වූ ගංවතුරමය තත්ත්වයන්, නාය යෑම්, නියඟය වැනි ස්වාභාවික ආපදා තත්වයන් මෙන් ම 2009 දී නිමාකරණ ලද බෙදුම් වාදී තිස් අවුරුදු යුද්ධය යනාදී තත්ත්වයන් නිසා රටේ විශාල වශයෙන් මිනිස් ජීවිත මෙන් ම භෞතික දේපල ද විශාල ලෙස විනාශ විය. මෙවැනි අනපේක්ෂිතව ඇති විය හැකි ආපදාමය කාලයන්හි දී මෙරට බහුතරයක දුප්පත් ජනයාට ලැබෙන ස්ථාවර ආදායම් මාර්ගයක් වශයෙන් මෙන් ම පුනරුත්ථාපනයට හා නැවත ගොඩනැගීමට උපකාරී වන්නා වූ වඩාත් ස්ථාවර කුටුම්භ ආදායම් මාර්ගයක් වශයෙන් විදේශීය ප්‍රේෂණ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට ඉතා වැදගත් වෙයි (IPS,2013).

තව ද ගොලීය ආර්ථික වටපිටාව තුල ඇතිවිය හැකි උච්චාවචනයන්ට ශක්තිමත්ව මුහුණ දීමේ හැකියාව ලබාදෙන මූල්‍ය ප්‍රවාහයක් ලෙස විදේශ ප්‍රේෂණ පෙන්වා දිය හැකි ය. 2007/2008 යන කාලයේදී ඇති වූ ඇමරිකානු මූල්‍ය අර්බුදය නිසාවෙන් ඇති වූ ආර්ථික පසුබෑසීම මුළු ලෝකය පුරා රටවලට බලපෑම් කරන ලදී. මෙම කාලයේ දී ශ්‍රී ලංකාවේ ද විදේශීය ආයෝජනයට, අපනයනයට, සංචාරක කර්මාන්තය යනාදී අංශයන්ට අහිතකර ලෙස බලපෑම තුළින් ගෙවුම් ශේෂ හිඟය පෙර වර්ෂයන්ට සාපේක්ෂව වැඩි විය (හේමචන්ද්‍ර, 2011). නමුත් මෙම ආර්ථික පසුබෑසීම ශ්‍රී ලංකා ආර්ථිකයේ බොහෝ අංශ වලට බලපෑම් කරනු ලැබුවත් විදේශ විනිමය ඉපැයුම් මාර්ගයක් වශයෙන් විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල වර්ධනයට බලපෑමක් නොවී ය. මෙම ගෝලීයමය අහිතකර තත්ත්වයන් ඉදිරියේ ද ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට විදේශ ප්‍රේෂණ ස්ථාවර විනිමය ඉපැයුම් මාර්ගයක් වශයෙන් විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පුළුල් අධ්‍යනයකට අනුව සඳහන් කරනු ලැබුවේ විදේශීය ප්‍රේෂණ විශාල වශයෙන් රටේ සංවර්ධන අපේක්ෂාවන් ගොඩනංවනවා මෙන් ම සාර්ව ආර්ථික ස්ථායිතාවයක් නිරන්තරයෙන් ගොඩනැගීමට දායක වන බවයි. මේ තුළින් අනපේක්ෂිතව හට ගත හැකි කම්පනයන්ගෙන් සිදුවන බලපෑම් අවම කිරීමට හේතු වන අතරම තව ද දුප්පත්කම අඩු කර රටේ බහුතර ජනයාගේ මූලික පාරිභෝජන වියදම්, නිවාස, අධ්‍යාපන, සෞඛ්‍ය වැනි වියදම් මෙන් ම ඔවුන්ගේ කුඩා පරිමාණ ව්‍යාපාර ආදියට පහසුකම් සැපයීමෙන් ආයොජන අංශය ශක්තිමත් කර රට තුළ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය වඩාත් වේගවත් කරන බවයි (බබාමා, 2012).

විදේශීය ප්‍රේෂණ සංවර්ධනයවන රටවල දුප්පත්කම දුරලීමට විශාල වශයෙන් දයක වෙයි. ඇඩම්ස් සහ පැගී (2011) විසින් කරන ලද අධ්‍යයනයකින් හෙළිවුයේ සංවර්ධනය වන රටවල දුප්පත්කම දුරලීමට විදේශීය ප්‍රේෂණ විශාල වශයෙන් දායක වන බව යි. ඔහුගේ මෙම අධ්‍යනයෙන් සනාථ වූයේ ඒක පුද්ගල අන්තර්ජාතික ප්‍රේෂණ 10% කින් ඉහළ යන විට දුප්පත්කම 3.5% කින් පහළ වැටෙන බව යි.ශ්‍රී ලංකාවේ ද දරිද්‍රතා අනුපාතය අද වන විට ක්‍රමයෙන් පහළ ගොස් ඇති අතර 2012/2013 ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණයට අනුව එම අගය 6.7%ක් වේ.බොහෝ සූක්ෂම මට්ටමේ අධ්‍යයන මගින් සනාථ කරන ලද්දේ විදේශීය ප්‍රේෂණ දුප්පත්කම දුරලීමට දායක වී ඇති බව යි. ප්‍රියදර්ශනි (2014) විසින් කොළඹ, කළුතර යන දිස්ත්‍රික්ක පාදක කරගෙන 150 කින් යුත් නියදියක් මූලික කරගත් අධ්‍යයනයෙන් සනාථ වූයේ විදේශීය ප්‍රේෂණ කුටුම්භවල ආදායම වැඩි වී පාරිභෝජනය වියදම මෙන් ම කුටුම්භ ඉතුරුම් වැඩිවන බවත් අධ්‍යාපනය හා සෞඛ්‍යය පහසුකම් වැඩි දියුණු වී දුප්පත්කම අඩුවන බවත් අවසානයේ දී කුටුම්භ සුබසාධනය ඉහළයන බව යි. මෙලෙස දුප්පත්කම අඩු වීම නිසා බොහෝ රටවල්වල අසමානතාව ඉවත්ව ගොස් ආර්ථික වෘද්ධියට හිතකර තත්ත්වයක් ඇතිව තිබේ. අසමානතාව හා දුප්පත්කම එක විට පවතින විට රජය විසින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී ඉහළ බදු පැනවීමට සිදුවේ. මෙය ආර්ථික කටයුතු වලට අහිතකර වන අතර ඉහළදුප්පත්කම හා අසමානතාව සමාජ හා දේශපාලන අස්ථාවරත්වයට බලපා යි. මෙය රටේ සංවර්ධන ක්‍රියාවලිය අඩපණ කිරීමට හේතුවක් වෙයි. මෙහි දී විදේශීය ප්‍රේෂණ අසමානතාවය හා දුප්පත්කම ඉවත් කිරිමට දායක වන අතර රටක ආර්ථික සංවර්ධනයට වඩාත් හිතකර තත්ත්වයක් වෙයි (උද්දින්, 2014).

ශ්‍රී ලංකාවේ විදේශීය ප්‍රේෂණ සූක්ෂම ආර්ථික විද්‍යා දෘෂ්ඨී කෝණයන්ගෙන් බලන විට කුටුම්භ, ව්‍යාපාර ආයතන යනාදී සූක්ෂම ඒකකයන්ට දැඩිව බලපෑම් කර යි. විදේශගත පුද්ගලයින්ගේ කුටුම්භ ආදායම් මට්ටම වැඩිවීම ට විදේශීය ප්‍රේෂණ හේතු වී ඇති අතර මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීමට බලපාන විහීනතා අඩු කිරීම ට මෙන් ම කෙටිකාලීන පාරිභෝගික භාණ්ඩ මෙන් ම දිගු කාලීන පාරිභෝගික භාණ්ඩයන්හි ද පාරිභෝජනය දිරිමත් කර ඇත. මෙහි දී කුටුම්භ සමාජිකයින්ගේ අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි පහසුකම් කරා ළඟා වීමට ඇති ඉඩ පස්තාව පුළුල් කර ඇති අතර ජීවන මට්ටම ඉහළ ගොස් අවසානයේ දී දිළිඳු බවේ විෂම චක්‍රයෙන් මිදීමට උපකාරී වී ඇත. මෙහි දී කුටුම්භයන්ගේ අනපේක්ෂිත තතත්වයන්ට මුහුණ දීමේ හැකියාව වැඩි දියුණු කර ඇති අතර කුටුම්භයන්ගේ වත්කම් නිර්මාණයට මාර්ග නිර්මාණය කර ඇත. කුටුම්භයන්ගේ ණය ගැතියාව අඩු කර ඇති අතර ලබා ගෙන ඇති ණය ආපසු ගෙවීමේ හැකියාව තව දුරටත් මෙමගින් ශක්තිමත් කර ඇත. මූල්‍යමය අතින් දුෂ්කර කුඩා පරිමාණ ග්‍රාමීය ආයෝජකයින් ට මෙන් ම ස්වයංරැකියා ලාබීන් හට කෘෂිකර්මය මෙන් ම ඕනෑම ආයෝජන මාර්ගයකට අවශ්‍ය මූල්‍ය සම්පත් විදේශීය ප්‍රේෂණ මගින් ලබා දෙයි (උද්දින්, 2014).

2013 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සංක්‍රමණය පිළිබඳ වාර්තාවේ දැක්වෙනුයේ ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති ආයතනය විසින් 2009/2010 වර්ෂයන්හි දී කුටුම්භ ආදායම් වියදම් සමීක්ෂණයක් සිදු කොට ඇති බව යි. මෙම අධ්‍යනයට අනුව ශ්‍රී ලංකාවේ කුටුම්භ ආදායමින් 6.5% ක් විදේශ ප්‍රේෂණ මගින් දායක වන බව තහවුරු වී ඇත. මෙම අධ්‍යයන ක්‍රමය සඳහා නැමියා ලකුණු ගැලපුම් ක්‍රමය (Propensity score matching) උපයොගී කොටගෙන ඇති අතර මෙහි දී සංක්‍රමණික පවුල්, සංක්‍රමණික නොවන පවුල්වල ට වඩා අධ්‍යාපනය, සෞඛ්‍ය, නිවාස වැනි වියදම් වල පැහැදිලි වෙනසක් ඇති බව හඳුනා ගෙන තිබේ (IPS,2013).

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශ වල මෙන් ම නාගරික ප්‍රදේශ වල ද ඉතුරුම් නැමියාව වැඩි වීම, ආදායම් ගුණකයේ අගය ඉහළයාම ට හේතු වී ඇති අතර සූක්ෂම මට්ටමින් කරන ලද අධ්‍යනයකින් තහවුරු වූයේ සංක්‍රමණ නොවන පවුල්වල ට වඩා සංක්‍රමණික පවුල් වැඩි ඉතුරුම් සඳහා පෙළඹෙන බවයි. ෂිවානි (2001)විසින් සඳහන් කර ඇත්තේ ශ්‍රී ලංකාවේ විදේශීය ප්‍රේෂණ වලින් 44.5% ක් ඉතුරුම් සඳහා යොමුවන බව යි. බොහෝ පිරිසක් මෙ ලෙස විදේශ සේවා නියුක්තිය සඳහා යොමු වනුයේ උපයා ගත ආදායම් වැඩි වශයෙන් ඉතුරු කිරීම සඳහා ය. මක් නිසාද යත් සේවය කිරීමට ඇති වසර ගණන සීමිත බැවින් මෙය ස්ථාවර ආදායම් මාර්ගයක් නොවීම යි (බබාමා, 2012).

**සමාලෝචනය**

ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්තිය ක්‍රමයෙන් වර්ධනය වී ඇති අතර විදේශ සේවා නියුක්තිකයින් විසින් මෙරට ට එවනු ලබන ප්‍රේෂණ ප්‍රවාහයේ වටිනාකම ක්‍රමයෙන් වර්ධනය වීමක් හඳුනා ගත හැකි ය. වර්තමානය වන විට විදේශීය ප්‍රේෂණ ශ්‍රී ලංකාවේ ප්‍රධාන විදේශ විනිමය ඉපැයුම් මාර්ගය වී ඇති අතර මෙරටට ගලා එන ප්‍රේෂණ ප්‍රවාහයන්ගෙන් අඩකට වැඩි බහුතර ප්‍රමාණයක් ලැබෙනුයේ මැදපෙරදිග කලාපයෙනි. බොහෝ අධ්‍යයන මගින් තහවුරු වූයේ ශ්‍රම සංක්‍රමණිකයින් විසින් මෙරට ට එවනු ලබන ප්‍රේෂණ ප්‍රවාහයන් ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය ට සාර්ව මෙන් ම සූක්ෂම මට්ටමින් ද බලපෑම් කර ඇති බව යි. සංවර්ධන ක්‍රියාවලිය ඔස්සේ ඉදිරියට යාමේ දී විදේශ විනිමය හිඟ වීමෙන් ඇතිවන සංවර්ධන ගැටළු සමනය කරලීමට විදේශීය ප්‍රේෂණ විශාල වශයෙන් දායක වෙයි. වඩාත් ස්ථාවර විනිමය ඉපැයුම් මාර්ගයක් වීමෙන් විදේශ විනිමය සංචිත ඒකරාශී වීමෙන් ගෙවුම් ශේෂ හිඟයට හිතකර වන අතර සාර්ව ආර්ථිකයේ ඇති විය හැකි අනපේක්ෂිත තත්ත්වයන්ට මුහුණ දීමට අවශ්‍යය හිතකර පරිසරය නිර්මාණය කරයි. තව ද ශ්‍රී ලංකාවේ ජාතික ඉතුරුම්, දරිද්‍රතාව, භෞතික හා මානව ප්‍රාග්ධනය රාශීකරණයට මෙන්ම මූල්‍යමය සංවර්ධනය ආදිය ට ධනාත්මක අයුරින් බලපායි. සූක්ෂම මට්ටමේ දී කුටුම්භයන්ට පාරිභෝජනය සුමටව කරගෙන යාමටත් ,ඉතුරුම් සහ වත්කම් ඒකරාශීකරණයටත්, මූල්‍ය සංරෝධක ලිහිල් කිරීමටත් මෙන් ම සෞඛ්‍ය, අධ්‍යාපනය යනාදී පහසුකම් වර්ධනය වී කුටුම්භ සුබසාධනය ඉහළ නැංවීමටත් විදේශීය ප්‍රේෂණ දායක වී ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**

අතපත්තු .ඩී (2012), මූලික ආර්ථික විද්‍යා ප්‍රවේශය 2,තරංජී ප්‍රින්ටර්ස් මහරගම.

අබේසිංහ.පී(1996මැයි 30),ජීවිතයක මැදපෙරදිග,දෙසතිය වෙළුම 19 රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව කොළඹ 03.

ආර්ථික විමසුම,(1981 අප්‍රේල්),පර්යේෂණ දෙපාර්තමේන්තුව, මහජන බැංකුව.

පතිරගේ ජේ.එම්.පී (2011),සංවර්ධන ආර්ථික විද්‍යාව න්‍යායන් හා සංකල්ප,ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

රුහුණගේ.එල්.කේ (1996), ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමනයේ ප්‍රවණතා අරේථික විමසුම, ජනවාරි වෙළුම 21, පර්යේෂණ දෙපාර්තමේන්තුව, මහජන බැංකුව.

ශ්‍රී ලංකා මහ බැංකුව (2015) වාර්ෂික වාර්ථාව, ශ්‍රී ලංකා මහ බංකුව, ඇම් ඩී ගුණසේණ මුද්‍රණකරුවෝ කොළඹ 01.

විදේශ රැකියා අමාත්‍යාංශය කාර්ය සාධන වාර්තාව (2015), විදේශ රැකියා අමාත්‍යංශය.

Annual Statistical Report of Foreighn employment 2013-2014,Sri lanka Bureau of Foreighn Employment.

Uddin. B,(2016),*Can Remittances Impact Economic Development? Review from Micro and Macro Perspectives*,IOSR Journal Of Humanities And Social Science (IOSR-JHSS).

Priyadarshani .U. G. M,(2014),*Impact of Worker's Remittances on Household Income and Welfare in Sri Lanka,*Faculty of Economics and Social Sciences Department of Development Studies University of Agder.

Bachama .Y. N,(2012),*The Impact and Sustainability of Remittances on Sri Lanka's Economic*,*Development*Journal of the Faculty of Graduate Studies, University of Kelaniya,
Vol. 1, 2012.

De.P.K and Ratha.D,(2012),*Impact of remittances on household income, asset and human capital:evidence from Sri Lanka* ,The World Bank, Washington, DC, USA.

Zanker .J.H ,(2015),*Effects of remittances and migration on migrant sending countries, communities and households.*

Hemachandra W.M ,(2011),*Financial crises and Impact of recent Financial crises on Sri Lanka*,volume 41 No 1&2-2011, Central Bank of Sri lanka.

Impact of Remittances on Poverty in Developing Countries, UNITED NATION, New York and Geneva,2011.

Migration Profile, Sri Lanka,(2013),Institute of Policy Studies of Sri Lanka.